# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2026 ජනවාරි / පෙබරවාරි

**සමාජීයවිද්‍යා පීඨය**

**පුරාවිද්‍යාව**
**(නව නිර්දේශය)**

**ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පුරාණ කලාව හා වාස්තු විද්‍යාව**

**ARCH 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පුරාණ කලාව යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්දැයි පැහැදිලි කොට පැරණි කලාව හැදෑරීම පුරාවිද්‍යා විෂයට වැදගත්වන ආකාරය විමසන්න.

02. පැරණි ගොඩනැඟිලි දොරටු ආශ්‍රිතව දැකිය හැකි කලා නිර්මාණ මොනවාදැයි හඳුන්වා ඉන් එක් (01) නිර්මාණයක දැකිය හැකි කලාත්මක වැදගත්කම පහදන්න.

03. මහනුවර අවධියේ බිතුසිතුවම්වල දැකිය හැකි විශේෂ ලක්ෂණ පැහැදිලි කොට ඒවායින් නිරූපණය වන තත්කාලීන සමාජය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

04. ශ්‍රී ලංකාවෙන් හමුවන හින්දු ප්‍රතිමා පිළිබඳ ප්‍රමාණවත් රචනයක් ලියන්න.

05. මෞර්ය යුගයේ කලාව හා වාස්තුවිද්‍යාවේ දියුණුව පිළිබඳව උදාහරණ සහිතව විමසන්න.

06. "මුගල් කලාව තුළ ඉන්දියාවේ අනෙකුත් කලා සම්ප්‍රදායන්ට වඩා සුන්දරත්වයට මුල්තැනක් ලබා දී ඇත." මෙම ප්‍රකාශය උදාහරණ සහිතව විමසන්න.

07. ඉන්දියාවේ ලෙන් විහාර ආශ්‍රිතව දැකිය හැකි කලාත්මක හා වාස්තුවිද්‍යාත්මක වැදගත්කම උදාහරණ සහිතව විස්තර කරන්න.

08. පහත මාතෘකා දෙකක් (02) පිළිබඳව ප්‍රමාණාත්මක ලෙස කරුණු දක්වන්න.

    i. ශ්‍රී ලංකාවේ ලී කැටයම්
    ii. ශ්‍රී ලංකාවේ ඇත්දල කැටයම්
    iii. ශ්‍රී ලංකාවේ කැටයම්වල නිරූපිත සත්ත්ව රූප
    iv. සීගිරි චිත්‍ර

********************************